2015 ඔක්තෝම්බර් 02

## <u>2015-2020 නව විෂය ධාරාව යටතේ ඒඒටී ශ්‍රී ලංකා විෂය නිර්දේශයේ සංශෝධන</u>

2015-2020 නව විෂය ධාරාව ඒඒටී ආයතනය විසින් දියත් කරන ලදුව, නව විෂය නිර්දේශය යටතේ 2015 ජූලි මස විභාගය පවත්වා, නියමිත කාලය තුලදී ප්‍රතිඵල ද දැනට නිකුත් කර ඇති බව ඔබ දන්නා කරුණකි.

(2) ප්‍රශ්න පත්‍ර ඇගයීමේ සාකච්ඡා වලදී අපගේ ලියාපදිංචි අධ්‍යාපන ආයතන වල දේශකවරුන්ගේ නිර්මාණාත්මක කරුණු දැක්වීම්ද, ශිෂ්‍ය ප්‍රජාවගේ ඉල්ලීම්ද, ඉතාමත් වැදගත් කාරණය වූ නව විෂය ධාරාව නිසා ශිෂ්‍යයන්ට මෙන්ම අධ්‍යාපන ආයතන වලටද මුහුණ පෑමට සිදුවී ඇති ප්‍රායෝගික දුෂ්කරතාද සැලකිල්ලට ගෙන, **2016 ජනවාරි විභාගයේ සිට ක්‍රියාත්මක කිරීම සඳහා, වහාම ක්‍රියාත්මක වන පරිදි,** 2015/2020 විෂය ධාරාව යටතේ බලපැවැත්වෙන විෂය නිර්දේශයේ පහත සඳහන් පරිදි සංශෝධන සිදු කිරීමේ වැදගත් තීරණ ගෙන ඇති බව මෙයින් සන්නිවේදනය කරමු.

පහත වගුවේ පෙන්වා ඇති ආකාරයට, පහත දැක්වෙන පරිදි විෂයයන් මට්ටම් අතර හුවමාරු කරනු ලැබේ:

| | | | |
|---|---|---|---|
| AA14 - ව්‍යාපාර නීතිය හා ආචාර ධර්ම (BLE) විෂය | - | AA1 මට්ටමෙන් | AA2 මට්ටමට |
| AA23 - ව්‍යාපාර මෙහෙයුම් කළමනාකරණය (BOM) විෂය | - | AA2 මට්ටමෙන් | AA1 මට්ටමට |
| AA24 - සංස්ථාපිත හා පුද්ගලික බදුකරණය (CPT) විෂය | - | AA2 මට්ටමෙන් | AA3 මට්ටමට |
| AA33 - ව්‍යාපාර කළමනාකරණය හා උපාය මාර්ග (BMS) විෂය | - | AA3 මට්ටමෙන් | AA2 මට්ටමට |

| ගිණුම් සහායක (AA1අදියර) | ගිණුම් විශ්ලේෂක (AA2අදියර) | ගිණුම් නිලධාරී (AA3අදියර) |
|---|---|---|
| AA14 - ව්‍යාපාර නීතිය හා ආචාර ධර්ම (BLE) → | | |
| ← | AA23 - ව්‍යාපාර මෙහෙයුම් කළමනාකරණය (BOM) | |
| | AA24 - සංස්ථාපිත හා පුද්ගලික බදුකරණය (CPT) → | |
| | ← | AA33 - ව්‍යාපාර කළමනාකරණය හා උපාය මාර්ග (BMS) |

(3) හුවමාරු කරන ලද විෂයයන්ගේ සංකේත ද පහත දැක්වෙන පරිදි වෙනස් වේ:

| විෂයය | දැනට තිබෙන සංකේතය | නව සංකේතය |
|---|---|---|
| ව්‍යාපාර මෙහෙයුම් කළමනාකරණය (BOM) | AA23 | AA15 |
| ව්‍යාපාර නීතිය හා ආචාර ධර්ම (BLE) | AA14 | AA25 |
| ව්‍යාපාර කළමනාකරණය හා උපාය මාර්ග (BMS) | AA33 | AA26 |
| සංස්ථාපිත හා පුද්ගලික බදුකරණය (CPT) | AA24 | AA35 |

(4) පහත සඳහන් විෂයයන්ගේ විෂය නිර්දේශ අන්තර්ගතයේ වෙනස්වීමක් සිදු නොවේ:

**ව්‍යාපාර මෙහෙයුම් කළමනාකරණය (BOM) විෂය**

**සංස්ථාපිත හා පුද්ගලික බදුකරණය (CPT) විෂය**

**ව්‍යාපාර කළමනාකරණය හා උපාය මාර්ග (BMS) විෂය**

කෙසේවෙතත්, මෙම විෂයයන් තුන (3) නැවත අනුයුක්ත කර තිබෙන මට්ටම් වලට ගැලපෙන ආකාරයට ඒවායේ ප්‍රශ්න පත්‍ර ව්‍යුහය සකස් කිරීමට ඉතා පැහැදිලි ලෙස තීරණය කර තිබේ.

(5) **ව්‍යාපාර නීතිය හා ආචාර ධර්ම (BLE)** විෂය නිර්දේශය, නව විෂය කොටස් කිහිපයක් ඇතුලත් වන පරිදි සංශෝධනය කර ඇත. සංශෝධන අනුව සකස් කළ නව නියමු ප්‍රශ්න පත්‍රය හා ස්වඅධ්‍යයන පාඨමාලාව සඳහා නව විෂය කොටස් ඇතුලත් අතිරේකය නුදුරු දිනයකදී නිකුත් කරනු ඇත.

(6) AA2 මට්ටමේ විභාග අයදුම්කරුවන් හට 2016 ජනවාරි විභාගයේදී පමණක් සංස්ථාපිත හා පුද්ගලික බදුකරණය (CPT) යන විෂය ට අයදුම් කිරීමට ඉඩදෙනු ලැබේ. **2016 ජනවාරි විභාගය සඳහා ව්‍යාපාර කළමනාකරණය හා උපාය මාර්ග (BMS) විෂය සහ සංස්ථාපිත හා පුද්ගලික බදුකරණය (CPT) යන විෂයයන් දෙකටම එකට අයදුම් කිරීමට ඉඩදෙනු නොලබන** බව විභාග අයදුම්කරුවන් සටහන් කර ගත යුතුය.

(7) AA1 මට්ටමේ ප්‍රශ්න පත්‍ර සඳහා වන **කාලය පැය 2 සිට පැය 3** දක්වා දීර්ඝ කරනු ලැබේ. AA1 මට්ටමේ ප්‍රශ්න පත්‍ර ව්‍යුහය පහත පරිදි වනු ඇත:

| | | | | |
|---|---|---|---|---|
| A කොටස | - | වාස්තවික ප්‍රශ්න සඳහා | ලකුණු 40 | (අනිවාර්ය ප්‍රශ්නයකි) |
| B කොටස | - | ලකුණු 10 බැගින් වූ ප්‍රශ්න 4 යි. | ලකුණු 40 | (අනිවාර්ය ප්‍රශ්න වේ) |
| C කොටස | - | ලකුණු 20 ප්‍රශ්න 1යි. | ලකුණු 20 | (අනිවාර්ය ප්‍රශ්නයකි) |
| | | එකතුව | **මුළු ලකුණු 100** | |

(8) **AA2 මට්ටමේ ප්‍රශ්න පත්‍ර ව්‍යුහයේ වෙනසක් සිදු නොවේ.**

(9) AA3 මට්ටමේ ප්‍රශ්න පත්‍ර ව්‍යුහය පහත සඳහන් පරිදි **සංශෝධනය** කර ඇත:

**A සහ B කොටස්වල වෙනසක් සිදු නොවේ.**

**C කොටසේ** දැනට දී තිබෙන තෝරා ගැනීමේ **විකල්පය ඉවත් කෙරෙනු ඇත. ඒ අනුව එකකට ලකුණු 25** බැගින් ලැබෙන **අනිවාර්ය ප්‍රශ්න දෙකක්** ඇතුලත් කෙරේ.

(10) අදාල මට්ටමේ ප්‍රශ්න පත්‍ර ව්‍යුහයට සරිලන ආකාරයෙන් පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලට අදාල නියම ප්‍රශ්න පත්‍ර සංශෝධනය කර 2015 ඔක්තෝම්බර් 20 වන විට යළි නිකුත් කිරීමට සෑම ප්‍රයත්නයක්ම දරනු ලැබේ:

<u>AA1 විභාගය</u>

AA11 - මූල්‍ය ගණකාධිකරණ මූලයන් (FAB)
AA12 - ව්‍යාපාර සඳහා ප්‍රමාණාත්මක ක්‍රම (QMB)
AA13 - ව්‍යාපාර හා ගිණුම්කරණය සඳහා ආර්ථික විද්‍යාව (EBA)
AA15 - ව්‍යාපාර මෙහෙයුම් කළමනාකරණය (BOM)

<u>AA2 විභාගය</u>

AA25 - ව්‍යාපාර නීතිය හා ආචාර ධර්ම (BLE)
AA26 - ව්‍යාපාර කළමනාකරණය හා උපාය මාර්ග (BMS)

<u>AA3 විභාගය</u>

AA31 - මූල්‍ය ගිණුම්කරණය හා වාර්තාකරණය (FAR)

AA32 - කළමනාකරණ ගිණුම්කරණය හා මූල්‍ය (MAF)

AA34 - ක්‍රියාවලීන්, පාලනයන් හා විගණනය (PCA)

AA35 - සංස්ථාපිත හා පුද්ගලික බදුකරණය (CPT)

(11) මීට පෙර ක්‍රියාත්මක වූ පරිදි, SS1 - ක්‍රියාකාරී සන්නිවේදන කුසලතා (ECS) සහ SS2 - තොරතුරු තාක්ෂණ කුසලතා (ITS) යන විෂයයන් **AA3 මට්ටමේ විභාග විෂයයන් හා සමඟ අයදුම් කිරීම අනිවාර්ය නොවේ.** AA1 මට්ටම සම්පූර්ණ කිරීමෙන් පසුව AA2, AA3 අදියර විභාග සමග හෝ වෙනමම පෙනී සිටිය හැකිය.

(12) **ක්‍රියාකාරී සන්නිවේදන කුසලතා (ECS) සහ තොරතුරු තාක්ෂණ කුසලතා (ITS)** යන ප්‍රශ්න පත්‍ර දෙක සඳහා උත්තර ලිවීමට දෙනු ලබන කාලය පැය දෙකේ **(2) සිට පැය (3) දක්වා** දීර්ඝ කර ඇත.

(13) විභාග ගාස්තු සහ නිදහස් කිරීමේ ගාස්තු වෙනුවෙන් ශිෂ්‍යයන්ට සාධාරණය ඉටු කිරීම සඳහා පහත සඳහන් සාධාරණ ගාස්තු ව්‍යුහය අනුමත කර ඇත:

| |
|---|
| AA1 මට්ටම - එක් විෂයයකට රු.700/- බැගින් |
| AA2 මට්ටම - එක් විෂයයකට රු.1,000/- බැගින් |
| AA3 මට්ටම - එක් විෂයයකට රු.1,100/- බැගින් |
| SS1 - ක්‍රියාකාරී සන්නිවේදන කුසලතා (ECS) විෂයට රු.1,000/- |
| SS2 - තොරතුරු තාක්ෂණ කුසලතා (ITS) විෂයට රු.1,000/- |

(14) 2016 ජනවාරි විභාගය පැවැත්වෙන්නේ **2016 ජනවාරි 30 හා 31 සහ පෙබරවාරි 6 සහ 7** යන දින වලය.

(15) කර ඇති සංශෝධන පිළිබඳව මෙම තොරතුරු දේශකවරුන්ට සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට හැකිතාක් ඉක්මනින් සන්නිවේදනය කිරීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් කරුණාවෙන් ඔබගෙන් ඉල්ලා සිටිමු.

(16) යම් පැහැදිලි කරවා ගැනීමක් වෙතොත් දුරකතනයෙන් නම් අංක (011) 2559669 මහින්ද විද්‍යුත් තැපැලෙන් නම්, nayoma@aatsl.lk හරහා ද සිදු කිරීම මැනවි.